| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>**Piliyandala Education Zone** | 33 | S | I |
|---|---|---|---|

| 11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2025 |
|---|---|
| ඉතිහාසය I | පැය එකයි<br>**One Hour** |
| නම :- | |

**සැලකිය යුතුයි :**

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරාගන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

(01) "වංසත්ථප්පකාසිනී" කෘතිය පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) දෙවන පැරකුම්බා රජු ලියන ලද ප්‍රශස්ති කාව්‍යයකි.

(ii) මහාවංශයට ලියවුණ ටීකාවයි.

(iii) ගම්පොළ යුගයේ ලියවුණ අටුවාවකි.

(iv) මහාවංශයේ පසුව ලියන ලද දෙවන කොටසයි.

(02) දැව හෝ විවිධ භාජන මත ලියන ලද ලේඛන,

(i) පුවරු ලිපි වේ. (ii) බ්‍රාහ්මී ලිපි වේ.

(iii) ආසන ලිපි වේ. (iv) අභිලේඛන වේ.

(03) බෝධි වංශය , ථූපවංශය වැනි ග්‍රන්ථ,

(i) ගම්පොළ යුගයේ සාහිත්‍ය කෘති වේ. (ii) මහනුවර යුගයේ සාහිත්‍ය කෘති වේ.

(iii) කුරුණෑගල අවධියේ සාහිත්‍ය කෘති වේ. (iv) අනුරාධපුර යුගයේ සාහිත්‍ය කෘති වේ.

(04) ශ්‍රී ලංකාවේ පිළිස්සූ මැටි වලං භාවිතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මුලින් ම ආරම්භ විය.

(ii) පූර්ව ඓතිහාසික යුගයේ මුලින් ම ආරම්භ විය.

(iii) මුල් ඓතිහාසික යුගයේ මුලින් ම ආරම්භ විය.

(iv) මුල් ඓතිහාසික යුගයෙන් පසුව ආරම්භ විය.


EXAMRESULTS.LK

(05) ගල් ලෙන්වල කටාරම් අසල ලියූ සෙල්ලිපි,

(i) ගිරි ලිපි වේ. (ii) ලෙන් ලිපි වේ.

(iii) ආසන ලිපි වේ. (iv) පුවරු ලිපි වේ.

(06) A - තතවය B - තුලාධාර C - කුම්භකාර

ඉහත පැරණි මූලාශ්‍රවල සඳහන් වචන වලින් කියවෙන පුද්ගලයන් A , B , C අනුපිළිවෙලට නිවැරදිව සඳහන්වන පිළිතුර තෝරන්න.

(i) රන්කරුවා - කැටයම්කරුවා - නූල් කටින්නා

(ii) නූල් කටින්නා - රන්කරුවා - මැටි භාණ්ඩ නිපදවන්නා.

(iii) ඇත්දළ කැටයම්කරුවා - මැණික් කපන්නා - මැටි භාණ්ඩ නිපදවන්නා

(iv) නූල් කටින්නා - යකඩ වැඩ කරන්නා - රන්කරුවා

(07) සීගිරියේ ජලමල් පිළිබඳව නිවැරදි වරණය තෝරන්න.

(i) ස්වභාවික ජල පීඩනයෙන් ක්‍රියා කරයි - සීගිරි ගල මුදුනේ දක්නට ලැබේ.

(ii) ජලමල් ගණන හතරකි - නැගෙනහිර ජල උද්‍යානයේ දක්නට ලැබේ.

(iii) බටහිර ජල උද්‍යානයේ පිහිටා ඇත - ස්වභාවික ජල පීඩනයෙන් ජලමල් ක්‍රියාකරයි.

(iv) ස්වභාවික ජල පීඩනයෙන් ජලමල් ක්‍රියාකරයි - නැගෙනහිර ජල උද්‍යානයේ පිහිටා තිබේ.

(08) හෝපිටිගමුව වෙළඳපොල සම්බන්ධව සෙල්ලිපියක් පිහිටවූ රජතුමා වන්නේ,

(i) පස්වන කාශ්‍යප රජු (ii) තුන්වන උදය රජු

(iii) පළමු අග්බෝ රජු (iv) හතරවන උදය රජු

(09) පහත දැක්වෙන පැරණි ආහාර සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ආහාර පිසීමට ගන්නා තෙල් පොදුවේ "කනතෙල්" ලෙස හඳුන්වා තිබේ.

(ii) බැදුම - මැල්ලුම යන ක්‍රම දෙක පමණක් අතීතයේ එළවළු පිසීමට යොදාගෙන ඇත.

(iii) කැඳ වර්ග අතීතයේ රෝගීන්ට ලබා දී නැත.

(iv) මස් මෙන්ම මාලු ප්‍රභූවරුන්ට පමණක් නිර්දේශ කළ ආහාර වේ.

(10) පහත දැක්වෙන ප්‍රකාශ කියවා නිවැරදි ප්‍රකාශය ඒ අතරින් තෝරන්න.

(i) ගෘහ දණ්ඩ නීතියෙන් පරුමකයන්ට දඬුවම් පමුණුවන ලදි.

(ii) සොරබොර වැව ටැම් ලිපියෙන් වෙළඳපොල නීතිරීති විස්තර වේ.

(iii) මාඝාත නීතියෙන් ජලජ පක්ෂීන් මැරීම තහනම් කරන ලදි.

(iv) නියමිත කාලයට සීසෑම ගැන බුද්දන්නේහෙල සෙල් ලිපියෙන් කියවේ.

(11) පහත දැක්වෙන තොරතුරු අතීතයේ ලාංකික සමාජය පිළිබඳවයි. එම තොරතුරු කියවා බලා ඒ අතරින් ලාංකික සමාජය ගැන කියවෙන නිවැරදි තොරතුර තෝරන්න.

(i) අතීතයේ ප්‍රභූ ජනතාව කුඩීන් ලෙස හඳුන්වා ඇත.

(ii) තැනින් තැන ගල්ගුහාවල වාසය කිරීම ස්ථිරවාසිතාවයි.

(iii) ධනවතුන් දුප්පතුන් ලෙස සමාජය බෙදීයාම සමාජ ස්ථරායනයයි.

(iv) නගරවල හා පුරවර ආශ්‍රිතව වැව් ගම්මාන දැකිය හැකි විය.

(12) ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ පාලනය යටත් කරන ලද්දේ,

(i) වෙරළබඩ ප්‍රදේශවල හටගත් කැරැල්ල අවසානයේ දී ය.

(ii) මදුරාසි පාලනය අවසානයේ දී ය.

(iii) මියුරත් කොමිසමේ නිර්දේශ ලබාදීමෙන් පසු ය.

(iv) ද්විත්ව පාලනය අවසානයේ දී ය.

(13) "කැකුලන්දල සිරිවර්ධන පතිරාජ" නම් තැනැත්තකුගේ කැරැල්ලක් මර්දනය කිරීම සම්බන්ධව සිද්ධියක් සඳහන් වන්නේ,

(i) ගම්පොල යුගයේ ය.

(ii) සීතාවක රාජධානි යුගයේ ය.

(iii) කෝට්ටේ යුගයේ ය.

(iv) මහනුවර යුගයේ ය.

(14) රන්දෙණිවෙල සටනේ දී පෘතුගීසි හමුදාවට නායකත්වය දුන් පෘතුගීසි කපිතාන්වරයා වන්නේ,

(i) දොන් ජෙරනිමෝ ද අසවේදු

(ii) දියෝගෝ ද මේලෝ

(iii) කොන්ස්තන්තීනු ද සා

(iv) පේරෝ ලොපේස් ද සූසා

(15) A - රුධිර සංසරණ පද්ධතිය සොයාගැනීම.

B - ලෙඩ රෝග සෑදීමට හේතු හා ඒවාට ප්‍රතිකර්ම.

C - මුද්‍රණ යන්ත්‍රය සොයාගැනීම.

D - සූර්යයා වටා ග්‍රහයන්ගේ ඉලිප්සාකාර ගමන

ඉහත A , B , C , D පිළිවෙලින් ඒවා සොයාගත් අය දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) විලියම් හාවේ / ජොහැන්නස් ගුටෙන්බර්ග් / පැරසල්සස් / නිකලස් කොපර්නිකස්

(ii) විලියම් හාවේ / පැරසල්සස් / ජොහැන්නස් ගුටෙන්බර්ග් / ජොහැන්නස් කෙප්ලර්

(iii) පැරසල්සස් / විලියම් හාවේ / ජොහැන්නස් කෙප්ලර් / ජොහැන්නස් ගුටෙන්බර්ග්

(iv) මයිකල් සර්වෙස් / පැරසල්සස් / ජොහැන්නස් ගුටෙන්බර්ග් / නිකලස් කොපර්නිකස්

(16) ක්‍රි.ව. 1344 දී යාපනයට පැමිණ එහි පාලකයා වූ ආර්ය චක්‍රවර්තිගෙන් උපකාර ගෙන ශ්‍රීපාදය වන්දනා කිරීමට ගිය අරාබි ජාතිකයා වූයේ,

(i) සුලෙයිමාන්

(ii) අල්බලසූරි

(iii) ඉබන් බතුතා

(iv) ඉබන් ෂහ්රියර්

(17) A - කාලිංග මාඝ පළවාහැරීම සිදු කිරීම.

B - ජාවක චන්ද්‍රභානු පරාජය කිරීම සිදු කිරීම.

ඉහත AB සිදුවීම් සම්බන්ධ රජවරුන් ගැන කියවෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) A දෙවන පරාක්‍රමබාහු රජු B තුන්වන විජයබාහු රජු

(ii) A හා B සිදුවීම් දෙකම දෙවන පරාක්‍රමබාහු රජු

(iii) A දෙවන පරාක්‍රමබාහු රජු B පළමු පරාක්‍රමබාහු රජු

(iv) A හා B සිදුවීම් දෙකම පළමු පරාක්‍රමබාහු රජු

(18)

| | අ | ආ |
|---|---|---|
| 1. | මෝසම් සුළඟ | A මල්වතු ඔය |
| 2. | කිවුල් ජලය | B අත්තිවාරම |
| 3. | ගල් පාලම | C ඌරාකැට ලිං |
| 4. | නවතීතනම් මැටි | D බලංගොඩ සමතල වැව |

- "අ" තීරුවේ දැක්වෙන ඒවා "ආ" තීරුවට කිනම් හෝ ආකාරයක සම්බන්ධයක් පෙන්වයි. ඒ අනුව 1, 2, 3, 4 නිවැරදිව A , B , C , D ගැලපූ විට පිළිතුර තෝරන්න.

(i) D C B A (ii) D C A B (iii) A B D C (iv) B C A D

(19) මහා බ්‍රිතාන්‍යයේ දකුණු වේල්සය යෝක්ෂයර් / ලැංකෂයර් යන ප්‍රදේශ පිළිබඳව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) පේෂ කර්මාන්තයට ප්‍රසිද්ධ වේ.

(ii) කපු වගාවට ප්‍රසිද්ධ වේ.

(iii) ගල් අඟුරු ආකර බහුල ප්‍රදේශ වේ.

(iv) අතිරේක ශ්‍රමය ලන්ඩනයට සපයන මධ්‍යස්ථාන වේ.

(20) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය පෙර යපස් උණු කිරීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) රෝලර් යන්ත්‍රය භාවිතයෙන් යපස් උණු කරන ලදි.

(ii) ගල් අඟුරු භාවිතයෙන් යපස් උණු කරන ලදි.

(iii) මියුල් යන්ත්‍රය යපස් උණු කිරීමට යොදාගත්තේය.

(iv) දර භාවිතා කරමින් යපස් උණු කරන ලදි.

(21) ජේත් රෝටල් - රොබට් බැක්වෙල් කාර්මික විප්ලවය සමයේ මේ දෙදෙනා නව නිෂ්පාදන ඉදිරිපත් කරන ලද ක්ෂේත්‍රය වන්නේ,

(i) සන්නිවේදන ක්ෂේත්‍රය (ii) ප්‍රවාහන ක්ෂේත්‍රය

(iii) කෘෂිකාර්මික ක්ෂේත්‍රය (iv) දේශපාලන ක්ෂේත්‍රය

(22) බ්‍රිතාන්‍යයන් ඉන්දියාවට පැමිණෙන අවධියේ මූගල් අධිරාජ්‍යයා වූ ජහන්ගීර් සමග වෙළඳ කටයුතු සම්බන්ධව සාකච්ඡා කළේ,

(i) විලියම් හොකින්ස් (ii) ජෝන් ෆයිබස්

(iii) කර්නල් මියුරන් (iv) රොබට් ඇන්ඩෲස්

(23) A - ගුවන්යානා නිපදවීම. B - කාර්මික නිෂ්පාදන පුළුල් වීම.

C - ළමා ශ්‍රමිකයන් බිහිවීම. D - විදුලි පණිවිඩ ක්‍රමය.

ඉහත A , B , C , D සම්බන්ධ කාර්මික විප්ලවය සමයේ විවිධ තොරතුරු හා ඒවා සම්බන්ධ ක්ෂේත්‍ර පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) ප්‍රවාහන - ආර්ථික - සන්නිවේදන - සමාජ

(ii) ආර්ථික - සමාජ - සන්නිවේදන - ප්‍රවාහන

(iii) ප්‍රවාහන - ආර්ථික - සමාජ - සන්නිවේදන

(iv) සමාජ - සන්නිවේදන - ආර්ථික - ප්‍රවාහන

(24)

| | අ | | ආ |
|---|---|---|---|
| 1. | 1796 | A | ලංකාවට ප්‍රථම ආණ්ඩුකාරවරයා පැමිණීම. |
| 2. | 1798 | B | ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ යටත්විජිත කිරීම. |
| 3. | 1802 | C | ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ ඉංග්‍රීසින් අල්ලා ගැනීම. |

- **"අ" තීරුවේ දැක්වෙන වර්ෂ "ආ" තීරුවේ A , B , C හා ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.**

(i) A C B (ii) C A B (iii) B A C (iv) A B C

(25) 1815 කන්ද උඩරට ගිවිසුමෙ මුල් වගන්ති තුනෙන් දැක්වෙන්නේ,

(i) උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් වූ බව ය.

(ii) උඩරට නිලධාරීන්ගේ සම්ප්‍රදායික අයිතිවාසිකම් සුරකින බව ය.

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට සහ ඥාතීන්ට සිංහාසනයට තිබූ උරුමය අහෝසි වීම.

(iv) පූජ්‍යස්ථාන , භික්ෂූන් වහන්සේලා , දේවාගම් , බෞද්ධාගම ආරක්ෂා කරන බවයි.

(26)

| | අ | | ආ |
|---|---|---|---|
| 1. | පොල්ගස් බද්ද | A | දෙවන නිදහස් සටන |
| 2. | මුඩුබිම් පනත | B | 1797 වෙරළබඩ කැරැල්ල |
| 3. | දොරේසාමි | C | පළමු නිදහස් සටන |

- **"අ" තීරුවේ දැක්වෙන ඒවා "ආ" තීරුවේ A , B , C හා පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.**

(i) C A B (ii) B C A (iii) A B C (iv) B A C

- **27 , 28 ප්‍රශ්න සඳහා පහත A , B , C , D යොදාගන්න.**

A - කෝල්බෲක් කැමරන් B - කෲව් මැකලම්

C - ඩොනමෝර් D - සෝල්බරි

(27) සර්වජන ඡන්ද බලය මුල්වරට ලැබීම හා උගත් ලාංකික නියෝජිතයෙක් මුල්වරට ව්‍යවස්ථාදායකයට ඇතුළත් කිරීම යන කරුණු දෙක සම්බන්ධ නිවැරදි ආණ්ඩුක්‍රම දෙක දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) C හා D (ii) B හා A (iii) C හා B (iv) C හා A

(28) අග්‍රාණ්ඩුකාර තනතුර ප්‍රථම වතාවට ඇතිකිරීම හා ව්‍යවස්ථාදායකය තුළ මුදල් ලේකම් යන තනතුර මුල්වරට ඇතිකිරීමට හා සම්බන්ධ ආණ්ඩුක්‍රම දෙක පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) D හා A (ii) D හා B (iii) D හා C (iv) C හා A

(29)

| අ | ආ |
|---|---|
| 1. අරුමුග නාවලර් | A මුස්ලිම් නෙයිසන් පුවත්පත ආරම්භ වීම. |
| 2. පොන්නම්බලම් රාමනාදන් | B ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති. |
| 3. පොන්නම්බලම් අරුනාචලම් | C උදයභානු පුවත්පත ආරම්භ කිරීම. |
| 4. සිද්ධි ලෙබ්බේ | D උගත් ලාංකික තනතුර මුල්වරට ව්‍යවස්ථාදායකයට පත්වීම. |

- **"අ" කොටසේ 1, 2, 3, 4 සමග පිළිවෙලින් "ආ" කොටසේ A , B , C , D නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.**

(i) C D B A (ii) D C B A (iii) A D C B (iv) C D A B

(30) ඉංග්‍රීසි පාලන සමයේ මිෂනාරි සමාගම් හා බෞද්ධයන් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රකාශන පහත A , B , C , D වල දැක්වේ.

A - මාසික තැග්ග - ලංකා නිධානය - ලක්මිණි පහන

B - උරගල - මාසික තැග්ග - ලංකා නිධානය

C - ලංකා නිධානය - ලංකා ලෝකය - උරගල

D - ලංකා ලෝකය - ලංකා නිධානය - මාසික තැග්ග

ඉහත A , B , C , D අතරින් මිෂනාරීන්ගේ ප්‍රකාශන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) D (ii) B (iii) C (iv) A

(31) උඩරට පහතරට ඒකාබද්ධ කිරීම / විධායක කාරක සභා / මහජන මන්ත්‍රී මණ්ඩලය

ඉහත යෝජනා මුල්වරට හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණය / 1920 මැනිං ප්‍රතිසංස්කරණය / 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

(ii) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය / 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණය / 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණය

(iii) 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණය / 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය / 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණය

(iv) 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණය / 1920 මැනිං ප්‍රතිසංස්කරණය / 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණය

- **පහත වගුවේ A , B , C , D , E අනුව 32 , 33 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

  - A ටොරින්ටන් සාමි
  - B කැප්පෙටිපොල
  - C බිම්පාළු ප්‍රතිපත්තිය
  - D වීර පුරන් අප්පු
  - E ගොංගාලේගොඩ බණ්ඩා

(32) කන්ද උඩරට පළමු නිදහස් සටන සඳහා පමණක් සම්බන්ධ අක්ෂර ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) B C A (ii) A B C (iii) B C (iv) D E

(33) දෙවන නිදහස් සටන හා සම්බන්ධ අක්ෂර ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) A B C (ii) D E C (iii) B C E (iv) A D E

| A තීරුව | B තීරුව | |
|---|---|---|
| ඇන්.ඇම්. පෙරේරා | A | වතු කම්කරු නායක |
| ඒ.ඊ. ගුණසිංහ | B | සමසමාජ පක්ෂය |
| නටේස අයියර් | C | නාගරික කම්කරු නායක |

(34) ඉහත A තීරුවේ නායකයෝ B තීරුවට ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

(i) A B C (ii) B C A (iii) B A C (iv) C B A

(35) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මූලාසනය හෙබවූයේ,

(i) ආණ්ඩුකාරවරයා විසිනි. (ii) අගමැතිවරයා විසිනි.

(iii) කථානායකවරයා විසිනි. (iv) නාමික ජනාධිපතිවරයා විසිනි.

(36) 1947 සෝල්බරි පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් කියවෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(i) එක්සත් ජාතික පක්ෂය වැඩිම ආසන ගණනක ලබා ගත්තේය.

(ii) එක්සත් ජාතික පක්ෂය සම සමාජ පක්ෂය සමග එකතු වී ආණ්ඩුව පිහිටුවීය.

(iii) S.W.R.D. බණ්ඩාරනායක මහතා ප්‍රථම අගමැතිවරයා ලෙස තේරී පත්විය.

(iv) කිසිදු දේශපාලන පක්ෂයකට ආසන 30 කට වඩා ලබාගත නොහැකි විය.

(37) රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඡන්දයෙන් පත් වූ මහජන නියෝජිතයන් ගණන,

(i) 49 කි. (ii) 61 කි. (iii) 50 කි. (iv) 101 කි.

- පහත දැක්වෙන A , B , C , D යුගල ඇසුරින් 38 , 39 , 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. 1. තේ වගාව
2. ලූල් කඳුර වතුයාය

B. 1. කෝපි වගාව
2. කෝපි කොළ රෝගය

C. 1. රබර් වගාව
2. තලවාකැලේ

B. 1. මධ්‍යම පන්තිය
2. අධ්‍යාපනය

(38) පළමුවැන්නේ පරිහානියට දෙවැන්නේ බලපෑමක් සහිත යුගලය වනුයේ,

(i) B (ii) A (iii) D (iv) C

(39) දෙවැන්නේ වර්ධනය නිසා පළමුවැන්නේ දියුණුවක් පෙන්නුම් කරන යුගලය වනුයේ,

(i) B (ii) C (iii) D (iv) A

(40) පළමුවැන්නේ හා දෙවැන්නේ කිසිදු සම්බන්ධයක් නොපෙන්වන යුගලය වන්නේ,

(i) B (ii) D (iii) C (iv) A

(ලකුණු 2 x 40 = 80)

| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>**Piliyandala Education Zone** | 33 | S | II |
|---|---|---|---|

11 ශ්‍රේණිය — දෙවන වාර පරීක්ෂණය - 2025

ඉතිහාසය II — පැය තුනයි / **Three Hours**

නම :-

සැලකිය යුතුයි :

(i) I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි සියළුම කොටස්වලට පිළිතුරු සපයන්න.

(ii) II කොටසේ 2, 3, 4, 5, 6, 7 යන ප්‍රශ්නවලින් කැමති ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(iii) III කොටසේ 8, 9 ප්‍රශ්නවලින් කැමති ප්‍රශ්න එකක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.

✍ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව <u>හයකි</u>.

## I කොටස

(01) අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1) ලංකා පටුන | 2) පොම්පරිප්පු | 3) මාතොට | 4) ගල්ඔය ජලාශය |
| 5) පරාක්‍රම සමුද්‍රය | 6) පදවිය වැව | 7) කෝට්ටේ | 8) ගම්පොළ |
| 9) දැදුරු ඔය | 10) ගෝකණ්ණ | 11) කිරිඳි ඔය | 12) මහියංගනය |

(ල. 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කරන්න.

| | | |
|---|---|---|
| 1) ලන්ඩන් | 2) ඉතාලිය | 3) සුමාත්‍රා දූපත |
| 4) රෝමය | 5) කළු මුහුද | 6) කොරියානු අර්ධ ද්වීපය |

(ල. 6)

ආ) පහත A , B , C , D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මහා වංශයේ මුල් කොටස රචනා කළ මහානාම හිමියන් වැඩ වාසය කළ පිරිවෙන.

B - අතීතයේ සිට පැවත එන, ගව සම්පත ආරක්ෂාව උදෙසා ඌව හා සබරගමු පළාත්වල පවත්වන ලද ශාන්තිකර්මය.

C - ලංකා කම්කරු සංගමය පිහිටුවීමට පුරෝගාමියා වූ ශ්‍රී ලාංකික කම්කරු නායකයා.

D - ලංකාවේ බෞද්ධ පුනරුද සමයේ ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීමට මුල් වූ භික්ෂූන් වහන්සේ

(ල. 4)

ඇ) (i) A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A රූපය



1) - A රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?

2) - එය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක් ද?

3) - මෙය ඉදිකර ඇති සම්ප්‍රදාය කුමක්ද ?

4) - මෙවැනි නිර්මාණ පරිහානියට පත්වීමට හේතුව කුමක් ද? (ල. 4)

(ii) 1) - B රූපයෙන් භික්ෂූන් වහන්සේ කවු ද?

B රූපය



2) - උන් වහන්සේ සම්බන්ධ වූ ප්‍රසිද්ධ වාදය කුමක් ද?

3) - මේ වාදයේ පිටපත් කියවා ලංකාවට පැමිණි ඇමරිකානු ජාතිකයා කවු ද?

4) - උන් වහන්සේ වැඩ විසූ විහාරස්ථානය නම් කරන්න. (ල. 4)

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුණු රාජ්‍ය තන්ත්‍රයේ සිටි නිලධාරීන් තිදෙනෙක් නම් කරන්න. (ල. 3)

(ii) සමීපයේ පිහිටි වැව් කිහිපයක් ඇල මාර්ගවලින් සම්බන්ධ කර ගනිමින් වැව් ප්‍රපතනය නිර්මාණය කිරීමට බලපෑ ප්‍රධාන අරමුණු 2 ක් සඳහන් කරන්න. (ල. 4)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය හිමි වූ ප්‍රධාන ආකාර දෙක නිදසුන් සහිතව කෙටියෙන් පහදන්න. (ල. 5)

(iv) I වන විජයබාහු රජතුමා අසල්වැසි රටවල් සමඟ පැවැත්වූ විදේශ සම්බන්ධතා 3 ක් උදාහරණ ලෙස දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)

(03) (i) අතීතයේ සෙල්ලිපි මූලාශ්‍රවල සඳහන් පහත දැක්වෙන වචනවලින් හැඳින් වූ පුද්ගලන් නම් කරන්න.

A - වත්හිමියන් වහන්සේ B - මහලේ C - දසගම් ඇත්තන් (ල. 3)

(ii) පහත දැක්වෙන අතීත සමාජයේ පැවති වචනවල තේරුම ලියන්න.

A - උපසග්ගරෝගනාස B - වසවසික සහටක

C - භාණකවරු D - කෙටු කනබ අය (ල. 4)

(iii) අතීත සමාජයේ දියුණු වෘත්තීන් පැවති බවට උදාහරණ 2 ක් ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(iv) අතීත බුදු දහම, හින්දු දහම, ඉස්ලාම් දහම අප සමාජය තුළ පැවති බව නිදසුන් 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

(04) (i) පහත දැක්වෙන A , B , C සඳහා සුදුසු පිළිතුරු ලියන්න.

A - පැරණි ශ්‍රී ලංකාවේ 'වජ්‍ර චුම්බට' ලෙස අකුණු සන්නායකයක් භාවිත කළ බවට සාධක හමුවන ස්තූපය.

B - මල් කැටයම් 21 ක් සහිත වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක කොටසක් හමු වූ ස්ථානය.

C - ඇලහැර ඇල ඉදිකිරීමට මුල් කරගත් මහවැලි ගංගාවේ අතු ගංගාව (ල. 3)

(ii) අතීතයේ රුවන්වැලිසෑය ඉදිකිරීමේ දී එහි අත්තිවාරම තැනීමට යොදාගත් ද්‍රව්‍ය 4 ක් නම් කරන්න. (ල. 4)

(iii) අතීත වාරි කර්මාන්තයේ ජල කළමනාකරණයේ උච්චතම අවස්ථාව වැව් තැනීමයි, වැවක අංග දෙකක් නම්කර එම අංගවල කාර්යය පැහැදිලි කරන්න. (ල. 5)

(iv) ශ්‍රී ලංකාවේ අතීත

a) මැටි බඳුන් තැනීමේ තාක්ෂණය

b) නිවාස ඉදිකිරීමේ තාක්ෂණය

c) මැටි ඔරු සුසාන ඉදිකිරීමේ තාක්‍ෂණය පිළිබඳව උදාහරණ දෙමින් වෙන වෙනම විස්තර කරන්න. (ල. 6)

(05) (i) 17 වන සියවස අගභාගය වන විට ඉංග්‍රීසීන් විසින් ඉන්දියාවේ වෙළඳ මධ්‍යස්ථාන පිහිටු වූ ප්‍රදේශ 3 ක් නම් කරන්න. (ල. 3)

(ii) ඉංග්‍රීසීන් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ ප්‍රධාන හේතු 2 ක් දක්වන්න. (ල. 4)

(iii) 1815 කන්ද උඩරට ගිවිසුමේ අඩංගු වූ කරුණු 2 ක් ලියා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(iv) 1848 දෙවන නිදහස් සටනට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා 3 ක් ලියා විස්තර කරන්න. (ල. 6)

(06) (i) ඓතිහාසික මූලාශ්‍රය සොයාබලා පුරාවිද්‍යා ගවේෂණ හා පර්යේෂණ මගින් ලංකාවේ පැරණි සංස්කෘතිය උරුමය මතුකර ගැනීමට කටයුතු කළ යුරෝපීය උගතුන් තිදෙනෙක් නම් කරන්න. (ල. 3)

(ii) පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.

A - කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම.

B - අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්‍ෂා කරගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම.

C - නවකථාවල චරිත සංවාදයට ලක් කරමින් මද්‍යසාර භාවිතයේ අහිසි විපාක පෙන්වාදීම. (ල. 3)

D - දමිල සිසුන් සඳහා කාණ්ඩ තුනකින් යුතු පෙළපොත් නිර්මාණය කිරීම. (ල. 4)

(iii) ශ්‍රී ලංකාවේ අමද්‍යප ව්‍යාපාරය තුළ මද්‍යසාර භාවිතයට එරෙහිව එහි නායකයින් කටයුතු කළ ආකාරය නිදසුන් දෙකක් දෙමින් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) මිෂනාරීන් ලංකාව තුළ තම ආගම ව්‍යාප්ත කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග 3 ක් ලියා විස්තර කරන්න. (ල. 6)

(07) (i) ඕනෑම රටක පාලන කටයුතු මෙහෙයවන ප්‍රධාන ආයතන තුනකි. එම ආයතන තුන නම් කරන්න. (ල. 3)

(ii) 1956 බලයට පත් S.W.R.D. බණ්ඩාරනායක මහතා හඳුන්වා දුන් ප්‍රතිපත්ති හා ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් ලියන්න. (ල. 4)

(iii) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික මිනිස් අයිතිවාසිකම් දෙකක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා සතු බලතල තුනක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

## III කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න 1 ක් පමණක් තෝරාගන්න.**

(08) (i) වෙළඳාම දියුණුවීම නිසා 14 වන සියවස වනවිට යුරෝපයේ පැවති වෙළඳ නගර 3 ක් නම් කරන්න. (ල. 3)

(ii) පුනරුද සමයේ පහත දැක්වෙන නිර්මාණ ලොවට දායාද කළ පුද්ගලයන් A , B , C , D අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ නම් කරන්න.

A - පියෙටා ප්‍රතිමාව B - මොනාලිසා චිත්‍රය

C - මුද්‍රණ යන්ත්‍රය D - ඩිවීනා කොමීඩියා ග්‍රන්ථය (ල. 4)

(iii) යුරෝපයේ පුනරුද සමයට පෙර පැවති අඳුරු වැඩවසම් යුගයේ ලක්ෂණ 2 ක් ලියා පැහැදිලි කරන්න. (ල. 5)

(iv) පුනරුදය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා සංස්කෘතික වෙනස්වීමට බලපෑ ආකාරය කරුණු 3 ක් ලියා විස්තර කරන්න. (ල. 6)

(09) (i) 18 වන ශතවර්ෂයේ බ්‍රිතාන්‍යය හැර යටත්විජිත පිහිටුවාගෙන බහුල වශයෙන් වෙළඳ කටයුතුවල නිරත වූ යුරෝපා රටවල් 3 ක් නම් කරන්න. (ල. 3)

(ii) යුරෝපයේ සෙසු රටවල්වලට සාපේක්ෂව කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයෙන් ඉදිරියට පැමිණීමට බ්‍රිතාන්‍යයට හැකි වීමට බලපෑ සාධක 2 ක් ලියන්න. (ල. 4)

(iii) ගල් අඟුරු කැනීමේ දී කාර්මික විප්ලවයට පෙර කම්කරුවන් මුහුණදුන් අභියෝග 2 ක් ලියා කෙටියෙන් පහදන්න. (ල. 5)

(iv) කාර්මික විප්ලවයත් සමඟ යුරෝපයේ නව කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ භාවිතය නිසා කෘෂි ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇතිවීමට බලපෑ ආකාරය කරුණු තුනකින් විස්තර කරන්න. (ල. 6)